

# එක්වෙමු අපි සැවොම
# මැඩලන්නට කොරෝනා

## ස්වයං නිරෝධායනය ...

❖ පසුගිය සති දෙක තුළ කොරෝනා රෝගියකු බවට සැකකරන තැනැත්තකු ඇසුරු කර තිබේ ද? එසේ නම්, ඔබ වහාම ස්වයං නිරෝධායනයට යොමු විය යුතු ය.

- ➢ රෝග ලක්ෂණ පිළිබඳ ව අවධානයෙන් සිටින්න.
- ➢ නිවස තුළ සිටින අන් අයගෙන් වෙන් ව නිවසේ ම රැඳී සිටින්න.
- ➢ අන් අය සමග ගැවසීමේ දී අවම වශයෙන් මීටරයක් පමණ දුරස්ථව සිටින්න.
- ➢ සෞඛ්‍ය ආරක්ෂිත මුඛ ආවරණයක් පළඳින්න.
- ➢ කසින විට හෝ කිවිසින විට මුව ආවරණය කර ගන්න.
- ➢ නිරන්තරයෙන් සබන් යොදා අත් සෝදන්න.
- ➢ නිවසේ භාවිත කරන දෑ අනෙක් අය සමග හුවමාරු කර ගැනීමෙන් වලකින්න.
- ➢ ස්වයං නිරෝධායනය ආරම්භ කළ දින සිට අවම වශයෙන් දින 14 ක් මෙම ක්‍රමය අනුගමනය කරන්න.
- ➢ භාවිත කරන දෑ පිරිසිදු කර ගන්න සහ ඉවතලන දෑ විනාශ කරන්න.
- ➢ ඉවත දැමිය හැකි භාජනයක ආහාර ලබා ගන්න සහ රෝගියාට ම වෙන් වූ වැසිකිලි හා නාන කාමර භාවිත කරන්න.
- ➢ මෙම කාලය තුළ රෝග ලක්ෂණ මතුවුවහොත් වහාම පහත අංක අමතන්න.
  **011 2444480, 011 2444481, 011 5978720, 011 5978730, 011 5978734, 011 3071073 071 0107107, 117** හෝ **119** නැතහොත් lahd@police.lk ලිපිනයට ඊ-මේල් කරන්න

## ඔබ නිරෝධායන උපදෙස්වලට පටහැනිව ක්‍රියාකළහොත් සිදුවන්නේ කුමක් ද ... ?

❖ නිරෝධායන හා රෝග වැලැක්වීමේ ආඥා පනත අදාළ වේ.
- ○ ඔබ නිරෝධායන ක්‍රියාවලියට අනුගත කරවිය හැකිය.
- ○ ඔබගේ ගමන්බිමන් සීමා කළ හැකිය.
- ○ අන් අයගෙන් වෙන් කර තැබීම හෝ ප්‍රතිකාර සඳහා බලහත්කාරයෙන් වුව ද යොමු කිරීමට හැකිය.
- ○ ඊට අවනත නොවීම වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවටගෙන නඩු පැවරීමට හැකි වරදකි.
- ○ වරදකරුවකු වුවහොත් මාස **06** ක් දක්වා සිර දඬුවම් සහ / හෝ රු.**2,000/-** සිට රු.**10,000/-** දක්වා දඩයකට යටත් වේ.

❖ ලංකා දණ්ඩ නීති සංග්‍රහය අනුව ද වරදකි.
- ○ නොසැලකිල්ලෙන් හෝ හිතාමතා ම හෝ ද්වේශසහගතව රෝගය පැතිරීමට ඉඩ හැරීම, රෝගය පැතිරවීම හෝ නිරෝධායන රීති අනුගමනය නොකිරීම.
- ○ වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගත හැකිය.
- ○ මාස **06** සිට වසර **02** දක්වා සිර දඬුවමකට ද රු.**1,500/-** ක දඩයකට ද යටත් කළ හැකිය.

❖ වැරදි සඳහා අනුබලදීම ද වරදකි.
- ○ ඉහත වැරදි සඳහා අනුබලදෙන තැනැත්තන් ද සහාය වන තැනැත්තන් ද වරෙන්තුවක් නොමැතිව සිර භාරයට ගෙන නඩු පැවරීමට හැකිය.
- ○ වරදට අදාල දඬුවමට ම යටත් වේ.

❖ ඉහත වැරදි සඳහා යොදාගත් නිශ්චල / චංචල දේපළ ද තහනමට ලක්විය හැකිය.

**පොලිස්පති - ශ්‍රී ලංකා පොලීසිය**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව